**මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව - 2023**
------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳව විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලින් සභාවට ලබාදී තිබූ ප්‍රදාන එකතුව රු.36,718,030ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂෙය් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගන්නා බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) | භාණ්ඩ හා සේවාවන් නොලැබුණු හා ගෙවීම් තහවුරු නොකළ ගනුදෙනු 16කට අදාල එකතුව රු. 8,866,246ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ආදායමට මාරුකිරීමට කටයුතු කරමින් පවතින බව. | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1),(2) හා (3) | එකතුව රු. 1,721,468 ක් වූ කල් ඉකුත් වූ ලංසු තැන්පතු 04ක්, කුලී තැන්පතු 100ක් සහ ඇප තැන්පතු 04ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | ස්ථාන මාරුවී ගිය සහ සේවය අත්හැර ගිය නිලධාරීන් 07ක ගෙන් අයවිය යුතුව තිබූ සේවක ණය එකතුව රු.299,676ක් පසුගිය වර්ෂ 13ක සිට අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | නිරවුල් කිරීමට පියවර ගෙන ඇති බව. | හිඟ ණය අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.60,038,075ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,431,286ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 721,000 | 194,835 | 194,835 | - | 1,100,000 | 171,980 | 171,980 | - |
| කුලී | 21,395,700 | 25,465,436 | 25,490,958 | 2,241,146 | 25,749,480 | 20,702,378 | 19,669,220 | 2,612,653 |
| බලපත්‍ර ගාස්තු | 2,729,100 | 3,606,462 | 3,606,462 | - | 3,672,400 | 3,376,912 | 3,376,912 | - |
| වෙනත් ආදායම් | 52,895,730 | 66,301,439 | 66,993,389 | 2,837,300 | 28,530,390 | 33,970,286 | 33,970,286 | 3,529,250 |
| එකතුව | **77,741,530** | **95,568,172** | **96,285,644** | **5,078,446** | **59,052,270** | **58,221,556** | **57,188,398** | **6,141,903** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පාර්ශවයන් 08කගෙන් අයවිය යුතුව පැවැති මස්කඩ කුලී සහ වෙළෙඳ පොල බදුකුලී එකතුව රු. 1,665,522ක් මේ දක්වා අයකර නොමැති අතර පසුගිය වර්ෂ 01ක සිට වර්ෂ 02ක් දක්වා කාලයක් අඛණ්ඩව හිඟහිටිව පැවැතුණි. | අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | හිඟ කුලී අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලින් එකතුව රු. 21,702,465ක් වැයකර ඉදිකර තිබූ මුල්ලියවලෙයි කඩකාමර සංකීර්ණය අදාළ අරමුණු සඳහා උපෙයෝජනය නොකිරීමෙන් පසුගිය වර්ෂයේ සිට ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. | අඛණ්ඩව ක්‍රියාත්මක කිරිමට පියවර ගන්නා බව. | වත්කම් පූර්ණ ලෙස භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2013 වර්ෂෙය් උතුරු නැගෙනහිර පළාත්පාලන සේවා ප්‍රවර්ධනය කිරීමේ සැලැස්ම යටතේ එකතුව රු.9,792,252ක් වැයකර ඉදිකර තිබූ උන්නාප්පුලවු ළමා උද්‍යානය පසුගිය වර්ෂ 08 සිට අදාල අරමුණු සඳහා උපයෝජනය නොකිරීමෙන් පාළුවට ගොස් තිබුණි. | ළමා උද්‍යානයේ සවිකර තිබූ උපකරණ සභාවේ තීරණ පරිදි මුලතිව් වෙරළෙහි සවිකර භාවිතා කරමින් පවතින බව. | වත්කම් පූර්ණ ලෙස භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂයේ ක්‍රියාත්මක කළ මුලතිව් මධ්‍යම බස්නැවතුම් පොල ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සම්පූර්ණ නොකිරිම හේතුවෙන් එය සම්පූර්ණ කිරිමට සමාලෝචිත වර්ෂය මැදදී සභාවේ අරමුදලින් එකතුව රු.1,852,902ක් ගෙවීම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කාර්යයන් අවසන් නොකිරිමෙන් පසුගිය වර්ෂ 03ක කාලයක සිට මහජනතාව මෙම බස්නැවතුම් පල ප්‍රයෝජනවත් ආකාරයට පරිහරණය කිරිමට නොහැකිව පැවැති අතර මගී බස්රථද වෙනත් ස්ථානයක නවතා තිබුණි. | බස්නැවතුම් පල සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතින හෙයින් බස්නැවතුම් පලෙහි මෙහෙයුම් කටයුතු තාවකාලිකව නවතා ඇති බව. | ඉදිකිරිම් කටයුතු කඩිනමින් අවසන් කර මහජන පරිහරනය සඳහා විවෘත කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට රජයේ සහ රජයේ නොවන ආයතන විසින් ලබාදී තිබූ ට්‍රැක්ටර්, බවුසර්, ලොරිරථ, කසල බැහැර කිරීමේ ලොරි සහ යතුරු පැදි වශයෙන් රථ 12ක් මේ දක්වා සභාවට පවරා ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිමිකාරිත්වය මාරු කිරිමට කටයුතු කරමින් පවතින බව. | සභාවට පවරා ගැනීමට අප්‍රමාදය පියවර ගත යුතුය. |
| (ආ) | සභාවේ ප්‍රධාන කාර්යාලය සහ උපකාර්යාල 05ක් ඉදිකර තිබූ ඉඩම් මේ දක්වා සභාවට පවරා ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | -එම- |